දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :- 10/2012

බ/12/02/අයවැය
මූල්‍ය අංශය,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2012.03. 06

සියළුම කොමසාරිස්වරුන්,
සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරිවරුන්,
සහකාර බන්ධනාගාර අධිකාරිවරුන්,

## 2012 වර්ෂය සඳහා සකසුරුවම් ලෙස වියදම් කළමනාකරණය කිරීම හා පාලනය

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලද අයවැය අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක BD/RPR/232/2/2/02 හා 2011.11.04 දිනැති ලිපිය, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් ගේ අංක MRPR/05/02/6 හා 2011.12.29 දිනැති ලිපිය හා වියදම් පාලනය සම්බන්ධව 2011.12.30 දිනැති අයවැය චක්‍රලේඛ අංක 155 හා 2012.02.16 දිනැති අයවැය චක්‍රලේඛ අංක 156 මගින් පෙන්වා දී ඇති කරුණුද, 2012.01.17 දින පැවැති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී අමාත්‍ය ලේකම් විසින්ද, 2012.01.19 දින ගරු අමාත්‍යතුමා සමඟ පැවැති රැස්වීමේදී ගරු අමාත්‍යතුමා විසින්ද පෙන්වා ඇති කරුණු අනුව සියළුම වියදම් විශේෂයෙන් ජලය, විදුලිය, ඉන්ධන හා දුරකථන වියදම් කළමනාකරණය කර අරපිරිමැස්මෙන් යුතුව පාවිච්චි කිරීමට සියළුම මාණ්ඩලික නිලධාරීන් කටයුතු කල යුතු බවට ලබා දුන් උපදෙස් සම්බන්ධව අවධානය යොමුකර මාගේ පහත සඳහන් විධිවිධාන අනුගමනය කිරීමට සියළුම මාණ්ඩලික නිලධාරීන් කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

01. <u>වාහන පරිහරණය හා ඉන්ධන වියදම් දැරීම සම්බන්ධව.</u>

i. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99, 13/2008 හා 13/2008(iv) අනුව අනුයුක්ත වාහන හිමි නිලධාරීන් අදාල චක්‍රලේඛවල උපදෙස් අනුව අනුයුක්ත වාහන පාවිච්චි කිරීමටත් ඉන්ධන දීමනාව ලබා ගැනීමටත් කටයුතු කල යුතුය. අනුයුක්ත වාහන හිමිකම් ඇති නිලධාරීන් සංචිත වාහන භාවිතා නොකල යුතුය.

ii. බන්ධනාගාර මූලස්ථානයේ අනුයුක්ත වාහන හිමිකම් නොමැති මාණ්ඩලික නිලධාරීන් සඳහා (රා.ප.ච. 22/99 හා 1:3:1 සඳහන් තනතුරු) යාම ඒම සඳහා උපරිම කි.මී. 40 ක සීමාවට යටත්ව කණ්ඩායම් ප්‍රවාහනයට අනුමැතිය මා වෙතින් ලබා ගැනීමට කටයුතු කල යුතුය.

iii. බන්ධනාගාර ආයතන භාර මාණ්ඩලික නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම සම්බන්ධව දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 18/2006 හා 28/2005 අනුව කටයුතු කිරීමට

ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු අතර ඉන් පරිබාහිරව කටයුතු කර යම් පරීක්ෂණයකට හෝ විගණන විමසුමකට භාජනය වුවහොත් එහි වගකීම අදාල නිලධාරීන් පුද්ගලිකව දැරිය යුතු බවද සදහන් කරමි.

iv. වාහනවල ඉන්ධන කාර්යක්ෂමතාවය විටින් විට පරීක්ෂා කිරීමට අදාල මාණ්ඩලික නිලධාරීන් ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

v. වාහනවල ඉන්ධන පරිභෝජනය සීමා කිරීමේ පියවරක් ලෙස 2012 මාර්තු මස සිට සියලුම සංචිත වාහනවල (බස් රථ හැර) මාසික ඉන්ධන පරිභෝජනය උපරිම ඉන්ධන ලීටර 120 කට සීමා කළ යුතුය. තවද බන්ධනාගාර ආයතන භාර බන්ධනාගාර අධිකාරීවරුන් හා සහකාර බන්ධනාගාර අධිකාරීවරුන් සදහා 2005 ජුනි 02 වන දින කැබිනට් මණ්ඩල අනුමැතිය අනුව දෙපාර්තමේන්තු චක්‍රලේඛ 18/2006 හා 28/2005 අනුව රාජකාරී ගමන් සදහා භාවිතා කරනු ලබන වාහනය සදහාද උපරිම ඉන්ධන ප්‍රමාණය ලී. 120 කට සීමා කල යුතුය.

vi. වාහන පරිහරණය සම්බන්ධව අදාල චක්‍රලේඛවලට පටහැනිව දැනට වාහන හා ඉන්ධන භාවිතා කිරීම සිදුවන්නේ නම් ඒවා වහා නතර කිරීමට අදාල නිලධාරීන් කටයුතු කළ යුතුය.

**02. <u>කාර්යාලවල විදුලිය හා ජලය වියදම් කළමනාකරණය .</u>**

i. ජලය විදුලිය හා ඉන්ධන වියදම් සදහා 2012 ජනවාරි මස දරණ ලද වියදම මත පදනම්ව, එම සීමාව නොඉක්මවා ඉදිරි මාසවලදී වියදම් දැරීමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

ii. කාර්යාලීය වායුසමීකරණ යන්ත්‍ර පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා පමණක් ක්‍රියාත්මක කිරීමට ආයතන ප්‍රධානීන් , අංශ භාර නිලධාරීන් වග බලා ගත යුතුය.

iii. ඉන්ධන, විදුලිය, ජලය, යනාදිය අයවැය චක්‍රලේඛ අංක 156 අනුව අවම කර ගැනීමට අවශ්‍ය සියලුම ක්‍රියා මාර්ග ගත යුතුවේ. (චක්‍රලේඛයේ පිටපතක් අමුණා ඇත.) අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම, අත්‍යවශ්‍ය නොවන අවස්ථාවන්වල වායු සමීකරණ යන්ත්‍ර නිවා දැමීම, ජල කාන්දුවීම් වැනි නාස්තිවීම් වලක්වා ගැනීමට යනාදිය සදහා උපරිම උත්සාහයක් ගැනීමට සහ අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගන්න.

**03. <u>නිල නිවාසවල විදුලිය හා ජල බිල්පත් සම්බන්ධව කටයුතු කිරීම.</u>**

i. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු සියළුම නිල නිවාස සම්බන්ධව පරිපාලන කටයුතු සිදුවිය යුතුය. නිල නිවාසවලට අදාල ජල හා විදුලිය වියදම් නිල නිවාසය හිමි නිලධාරියා විසින් ගෙවිය යුතුය. රජයේ වියදමින් එම වියදම් නොදැරීමට අංශ ප්‍රධානීන් හා බන්ධනාගාර ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

ii. දැනට නිල නිවාස සදහා විදුලි මීටර හා ජල මීටර සවිකර නොමැති නම් කඩිනමින් ඒවා සවි කිරීමට අදාල ආයතන සමඟ සාකච්ඡා කර අදාල ඇස්තමේන්තු ගිණුම් අංශය වෙත යොමු කළ යුතු වේ. ඒ සදහා අවශ්‍ය ප්‍රතිපාදන බන්ධනාගාර කොමසාරිස් (මුදල්) විසින් ලබා දීමට කටයුතු කරනු ඇත. නිල නිවාසවල ජල හා විදුලිය වියදම් රජයේ වියදමින් පියවීමට ජල හා විදුලි මීටර සවි නොකිරීම හේතුවක් කර නොගැනීමට බන්ධනාගාර ආයතන ප්‍රධානීන් හා මාණ්ඩලික නිලධාරීන් වග බලා ගත යුතුය.

iii. බන්ධනාගාර රැඳවියන් විසින් සිදු කරන අනවශ්‍ය විදුලිය හා ජලය භාවිතා කිරීම් නැවැත්වීමට කටයුතු කිරීම බන්ධනාගාර ආයතන ප්‍රධානීන් ගේ වගකීමකි.

iv. විදුලිය හා ජලය නාස්තිවන අවස්ථාවන් සොයා බලා එවැනි අවස්ථාවන් අවම කිරීමට අවශ්‍ය යෝජනාවන් ඉදිරිපත් කිරීමටත් එම යෝජනාවන් ක්‍රියාත්මක කිරීමටත් අදාල කොමසාරිස්වරුන් හා බන්ධනාගාර ආයතන ප්‍රධානීන් වග බලාගත යුතුය.

v. ජල මීටර සහ විදුලි මීටර සවි කිරීම ප්‍රමාද වන්නේ නම් එතෙක් නිල නිවාසවල ජලය සහ විදුලිය අයකර ගැනීම සඳහා කමිටුවක් පත් කර එම. කමිටුවේ නිර්දේශ අනුව ගාස්තු අයකර ගත යුතුය. එම කමිටුව සඳහා විදුලිබල මණ්ඩලයේ හා ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරියෙකු ඇතුළත් විය යුතු අතර නිල නිවසේ සිටින පුද්ගලයන් ගණන, විදුලි උපකරණ ප්‍රමාණය වැනි කරුණු සැලකිල්ලට ගෙන සෑම නිල නිවසක් සඳහාම මාසික ස්ථාවර ගාස්තුවක් තීරණය කර, ඒ අනුව අදාල නිලධාරියාගේ වැටුපෙන් අය කිරීමට කටයුතු කළ යුතුය.

04. <u>අනෙකුත් වියදම් කළමනාකරණය</u>

i. ඉන්ධන හා විදුලිය, ජලය අරපිරිමැස්මට අමතරව දිනපතා පුවත්පත් මිලදී ගැනීම, දුරකථන බිල්පත්, විවිධ උත්සව මෙන්ම ඒ සඳහා ආරාධනාපත් , දින පොත්, සුබ පැතුම්පත් වැනි අත්‍යවශ්‍ය නොවන ක්‍රියාකාරකම් සඳහා කරනු ලබන වියදම් සීමා කිරීමට කටයුතු කළ යුතුය.

අයවැය දෙපාර්තමේන්තුවෙන් අමතර ප්‍රතිපාදන ලබා නොදීමත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කිරීම් අනුමත නොකිරීමත් සැලකිල්ලට ගෙන වියදම් පාලනය කිරීම සඳහා බන්ධනාගාර කොමසාරිස්වරුන්, මාණ්ඩලික නිලධාරීන් සහ බන්ධනාගාර ආයතන ප්‍රධානීන් අනිවාර්යයෙන් කටයුතු කල යුතුය. පසු ගිය වර්ෂයේ මෙන් විදුලිය ජලය වැනි අත්‍යවශ්‍ය සේවාවන් විසන්ධිවීම් වලක්වා ගැනීමට ඔබ සැමගේ සහයෝගය අත්‍යවශ්‍යවන බවත් ඒ පිළිබඳව ඔබගේ උනන්දුවත්, කැපවීමත්, ප්‍රමුඛතාවයත් ලබා දිය යුතු බව කාරුණිකව දන්වමි.

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත :- 01. ලේකම්, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.
02. අයවැය අධ්‍යක්ෂ ජනරාල්.
03. විගණකාධිපති.